රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 16/2018

මගේ අංකය :75/10/ IIIපොදු (II වෙළුම)
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2018.07.10

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් තනතුරුවලට පත් කිරීම / ස්ථාන මාරු කිරීම**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ හා ඉන් ඉහළ ශ්‍රේණිවල නිලධාරීන් තනතුරට පත් කිරීම/ස්ථාන මාරු කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී අදාළ ලිපි ලේඛන හා තොරතුරු අසම්පූර්ණව ඉදිරිපත් කිරීම හේතුවෙන් ඇති වන ප්‍රමාදයන් හා අනවශ්‍ය ලෙස සම්පත් වැය වීම වළක්වා ගැනීම සඳහා, පහත සඳහන් සියලුම ලිපි ලේඛන ඔබගේ නිරීක්ෂණ හා නිර්දේශයන් සමඟ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම පිණිස මා වෙත යොමු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

I. නිලධාරියා සේවයෙන් නිදහස් කිරීම සඳහා වර්තමාන සේවා ස්ථානයේ ප්‍රධානියාගේ එකඟතාවය.
II. නිලධාරියා සේවයට අනුයුක්ත කර ගැනීම සඳහා නව සේවා ස්ථානයේ ප්‍රධානියාගේ එකඟතාවය.
III. අදාළ නිලධාරියාගේ කැමැත්ත.
IV. ආවරණ ලිපියද ඇතුළුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කාර්ය මණ්ඩලයෙහි සහතික කළ පිටපතක් (අමාත්‍යාංශ සංශෝධන හා තනතුරට පත් කිරීමේ දිනය අනුව ඊට අදාළ කාර්ය මණ්ඩල අනුමැතිය ඉදිරිපත් කළ යුතුය.)
V. නිවැරදිව සම්පූර්ණ කරන ලද EST – 12 ආකෘති පත්‍රය
VI. නිලධාරියාගේ ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පැහැදිලි පිටපතක්.
VII. නිලධාරියා සම්බන්ධයෙන් ඇති විනය කටයුතු පිළිබඳ තොරතුරු.

02. තවද අදාළ නිලධාරියා උක්ත තනතුරෙහි රාජකාරි භාර ගත් පසු විධිමත් පත්වීමේ ලිපිය නිකුත් කිරීම සඳහා රාජකාරි භාර ගැනීමේ ලිපියේ පිටපතක් ද ඉදිරිපත් කරන ලෙස, වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

පද්මසිරි ජයමාන්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය